www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ජනාධිපති බලතල තවදුර ශක්තිමත් කිරීමේ ව්‍යවස්ථා සංශෝධන සම්මත කරයි

## Sri Lankan parliament amends constitution to entrench powerful presidency

**කේ. රත්නායක විසිනි**

**2010 සැප්තැම්බර් 11**

බදාදා, ශ්‍රී ලංකාවේ ආන්ඩුව, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ඒකාධිපති බලතල තවදුර ශක්තිමත් කරන මූලික ව්‍යවස්ථා සංශෝධන පාර්ලිමේන්තුව තුලින් සම්මත කර ගත්තේය. එම සංශෝධන මගින් ඔහුට ඕනෑම වතාවක් ජනාධිපති තනතුර සඳහා තරඟ කිරීමේ ඉඩකඩ ලැබෙන අතර ම, අධිකරනය, පොලීසිය, මැතිවරන කොමිෂම හා මහ බැංකුව මත ඔහුට සැලකිය යුතු මට්ටමේ පාලනයක් ද ලබා දෙයි.

ව්‍යවස්ථා සංශෝධන සම්මත කිරීමේ සමස්ත ක්‍රියාදාමයම ප්‍රජාතන්ත්‍ර විරෝධී ය. කිසිඳු අවස්ථාවක එම සංශෝධන පනත මහජනතාවට විවෘත කලේ නැත. ඒ වෙනුවට, කැබිනට් මන්ඩලය අගෝස්තු 31 එය අනුමත කලේය. යන්තම් එක් දින විභාගයකින් පසුව, පනත "ව්‍යවස්ථාවට අනුකූල" වන බව ශ්‍රේෂ්ඨාධිකරනය පාර්ලිමේන්තුවේ කතානායකවරයාට දැනුම් දුන්නේය. "හදිසි පනතක්" ලෙස ඉදිරිපත් කෙරුනු එම සංශෝධනය විවාදයට භාජන කොට ඡන්දය දීමට පාර්ලිමේන්තුවට ලැබුනේ එක් දිනක් පමනි.

පනතට සාමාජිකයන් 225ක් සිටින පාර්ලිමේන්තුවේ ඡන්ද 161ක් ලැබුනි. රාජපක්ෂගේ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස) සිටියේ මන්ත්‍රීවරු 144ක් පමනි. සති ගනනාවක් තිස්සේ තිරයෙන් පිටුපස කෙරුනු මන්ත්‍රීන් බාගැනීමේ හොර ගනුදෙනුවලින් පසුව, අවශ්‍ය තුනෙන් දෙකක බහුතරය ලබාගැනීමට ආන්ඩුව සමත් විය. විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂයේ (එජාප) මන්ත්‍රීන් 8ක් ද එජාප හවුල්කාර පක්ෂයක් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ (ශ්‍රීලමුකො) මන්ත්‍රීන් 8ක් ද පිල් මාරු කොට පනතට පක්ෂය ඡන්දය දුන්හ.

බදාදා එජාප පාර්ලිමේන්තුව වර්ජනය කලේ, එනයින් පනතට එරෙහිව ක්‍රියාශීලීව ඡන්දය පාවිච්චි කිරීම මගහරිමිනි. එයට සහභාගි වීම මගින් සිය දැත් "කිලිටි කර ගැනීමට" අවශ්‍ය නොවූ බවට එජාප වංචා සහගත කියාපෑමක් ද කලේය. යථා වසයෙන් ගත් කල, 1978 දී ගෙන එනු ලැබූ වත්මන් ව්‍යවස්ථාවට ඇතුලත් කෙරුනු වත්මන් පුලුල් ජනාධිපති විධායක බලතල සම්බන්ධයෙන් එජාප වගකිව යුතුය. එයින් අදහස් කෙරෙන්නේ, විධායක ජනාධිපතිට දැනටමත් මැතිවරනයෙන් වසරකට පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීම, ඕනෑම අමාත්‍යංශයක් පවරාගැනීම සහ හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම කල හැකි බවයි.

ජනවාර්ගික පදනමක් සහිත දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) මන්ත්‍රීන් 11ක් ද සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) නායකත්වය දරන ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයේ (ප්‍රජාස) මන්ත්‍රීන් 6ක් ද පනතට විරුද්ධව ඡන්දය දුනි. මෙම විරුද්ධත්වය ද පෙර සඳහන් කල අවස්ථාවට සමානව ම වංචාසහගතය. 2009 මැයි මාසයේ දී පරාජයට පත් වූ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ ඒජන්සියක් ලෙස කලින් ක්‍රියාත්මක වූ ටීඑන්ඒ දැන් ආන්ඩුව සමග එකඟතාවකට අර අඳිමින් සිටී. රාජපක්ෂගේ සිවිල් යුද්ධයට සහාය දුන් ජවිපෙ, දැන් සාමාන්‍ය ජනතාව අතර වැඩෙන අසන්තෘප්තියේ හිස ගසා දමනු වස් බොරු මවාපෑමක යෙදී සිටී.

ආන්ඩුව බදාදා පාර්ලිමේන්තුව දෙසට යොමු වන කොලඹ නගරයේ හා උපනගර ප්‍රදේශවල මාර්ගවල සිය ගනනක මිලිටරි හා පොලිස් භටයන් යොදවා තිබුනි. මෙම හමුදා බල ප්‍රදර්ශනය වනාහි රාජපක්ෂ තන්ත්‍රය මොන යම් හෝ විරුද්ධත්වයක් නොඉවසන බවට මතක් කිරීමක් විය. පනතට එරෙහිව එජාප විසින් සංවිධානය කරන ලද විරෝධතාව පොලීසිය විසින් මග අවුරා නතර කරන ලදි.

ව්‍යවස්ථා සංශෝධනය මගින් ප්‍රධාන වෙනස්කම් දෙකක් කරන ලදි. පලමු වැන්න, වසර හයක වාර දෙකකට ජනාධිපතිගේ ධුර කාලය සීමා

කරන 31 වන වගන්තිය අහෝසි කලේය. 1978 දී මෙම සීමාව හඳුන්වා දෙනු ලැබුවේ ජනාධිපතිගේ දුර දිග යන විධායක බලතල "සීමා කිරීමේ හා පාලනය කිරීමේ" විධික්‍රමයක් යයි කියාසිටිමිනි. එය ඉවත් කිරීම මගින්, රාජපක්ෂට දැන් ජනාධිපති තනතුර සඳහා කාල නියමයක් නැතිව තරග වැදිය හැකිය.

දෙවන වෙනස ව්‍යවස්ථාදායක මන්ඩලය පාර්ලිමේන්තු මන්ඩලයක් මගින් විස්ථාපනය කලේය. 2001 දී ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය මගින් තහවුරු කෙරුනු, පාර්ලිමේන්තුවේ කතානායකගේ සභාපතිත්වයෙන් යුක්ත, ව්‍යවස්ථාදායක මන්ඩලයේ අභිප්‍රාය වූයේ ආන්ඩුවේ හා අධිකරනයේ ප්‍රධාන තනතුරු පත් කිරීම අධීක්ෂනය කිරීම සහ පොලීසිය, රාජ්‍ය සේවාව සහ මැතිවරන කටයුතු නිරීක්ෂනය කරන ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීමයි. එහි සාමාජිකයන් නව දෙනා පත් කිරීම ජනාධිපතිට හා පාලක පක්ෂයට පමනක් නොව විරුද්ධ පක්ෂයට ද පැවරී තිබුනි. 17 වන සංශෝධනය හඳුන්වා දුන්නේ විධායක ජනාධිපති ක්‍රමය විසින් ආන්ඩුවේ යාන්ත්‍රනය දේශපාලනකරනය කිරීම පිලිබඳ පුලුල් විවේචන මධ්‍යයේ ය.

ඉහල පරිපාලන තනතුරුවලට සිය මූලික ඥාතිමිත්‍රාදීන් පත් කරනු පිනිස සිය ජනාධිපති තනතුර යොදා ගත් රාජපක්ෂ, ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින්, වසර ගනනාවක් තිස්සේ ව්‍යවස්ථාදායක මන්ඩලය අත්හිටුවාගෙන සිටියේය. එම මන්ඩලය පත් කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරනය ඔහුට නියෝග කල විට, ඔහු එම නියෝගය සරලවම නොතකා සිටියේය. දැන් ඔහු තමන් කරන පත් කිරීම් අහෝසි කල නොහැකි බව සහතික කරගනු පිනිස ව්‍යවස්ථාව වෙනස් කර ඇත. රාජපක්ෂ පාර්ලිමේන්තු මන්ඩලයේ සභාපතිත්වය දරනු ඇත. පාර්ලිමේන්තුවේ කතානායක, අගමැති හා විපක්ෂ නායක සහ ඔවුන් විසින් නම් කරනු ලබන අය එහි සාමාජිකයන් වන නමුදු, ප්‍රධාන තනතුරුවලට පත් කිරීමේ දී ජනාධිපති ඔවුන්ගේ "නිරීක්ෂන" ලබාගැනීම පමනක් අවශ්‍ය වනු ඇත. ඔහුට ඕනෑම විරුද්ධත්වයක් ප්‍රතික්ෂේප කල හැකිය.

සඳුදා තෝරාගැනුනු මාධ්‍ය කතුවරුන් පිරිසකට කතා කරමින්, රාජපක්ෂ කියාපෑවේ ව්‍යවස්ථා වෙනස්කම් ආන්ඩු ක්‍රියාදාමය "ප්‍රජාතන්ත්‍රකරනය" කරනු ඇති බවයි. ඔහුගේ සොහොයුරු සහ ආර්ථික සංවර්ධන ඇමති බැසිල් රාජපක්ෂ, කියා සිටියේ, සංශෝධන "පාර්ලිමේන්තුවේ බලය වැඩි කරන" බවයි. මෙම ප්‍රකාශ මුලුමනින්ම අසත්‍ය ය. සංශෝධන ජනාධිපති අත බලතල සංකේන්ද්‍රනය කරයි. පසුදින පැවති වෙනත් රැස්වීමක දී, රාජපක්ෂ අවධාරනය කලේ, "ආන්ඩුවේ අරමුන සංවර්ධන ප්‍රයත්නය නිර්බාධිතව දිගටම ගෙනයාම සහ දේශපාලන අස්ථාවරත්වයට කිසිදු අවකාශයක් නොතැබීම" බවයි.

මෙම වෙනස යුක්තියුක්ත කිරීමේ ප්‍රයත්නයක් ලෙස, රාජ්‍ය-පාලිත ඩේලි නිව්ස් පත්‍රය ආන්ඩු-ගැති "බුද්ධිමතුන්" ගනනාවකගේ අදහස් පල කලේය. සංශෝධනය "අතිශය යහපත්" පියවරක් ලෙස උත්කර්ශයට නංවමින්, ආචාර්ය ටී.සී. රාජරත්නම් මෙසේ ලිවීය: "සිංගප්පූරුව දේශපාලන ස්ථාවරත්වය මගින් ආර්ථික හා ප්‍රජාතාන්ත්‍රික සාර්ථකත්වය අත්පත් කරගැනීම පිලිබඳ සම්භාව්‍ය නිදසුනකි. සිංගප්පූරුව සාර්ථක වී ඇත්තේ දේශපාලන ස්ථාවරත්වය නිසාය. ලී ක්වාන් යූ 1959 සිට 1990 දක්වා සිංගප්පූරුවේ අගමැති ලෙස සේවය කලේය."

සිංගප්පූරුව ලී ක්වාන් යූ සහ ඔහුගේ පසුප්‍රාප්තිකයන් යටතේ පොලිස් රාජ්‍යයක් ලෙස ක්‍රියාත්මක වී ඇත. මැතිවරන නීති, සාපරාධී අපහාස නීති, මාධ්‍ය වාරනය හා පාලනය, සහ තවත් බොහෝ මර්දන විධික්‍රම තනි පක්ෂයක පාලනය සහතික කරන අතර වර්ජනය කිරීමේ හෝ විරෝධතා දැක්වීමේ කිසිදු අයිතියක් එහි නැත. කුප්‍රකට අභ්‍යන්තර ආරක්ෂක පනත නඩු විභාග නැතිව දිගුකාලීන රඳවා තැබීම් සඳහා ඉඩකඩ ලබා දෙයි.

"නිර්බාධිත සංවර්ධනය", "දේශපාලන ස්ථාවරත්වය", "සිංගප්පූරුව" සහ "ආර්ථික සාර්ථකත්වය" යනාදියට කරන සැඳහුම් පෙන්නුම් කරන්නේ රාජපක්ෂ තන්ත්‍රයේ යොමුව කොයි දිශාවට ද යන්නය. ආන්ඩුව ගෝලීය ආර්ථික අර්බුදයේ බර දිගේලි කරන තතු යටතේ, දේශපාලන විරුද්ධවාදීන් පමනක් නොව කම්කරු පන්තිය වෙතින් එල්ල වන ඕනෑම ප්‍රතිරෝධයක් තලා දමනු පිනිස ආඥාදායක විධිවිධාන ඉදිරියට දමයි.

ජනවාරි ජනාධිපතිවරනයෙන් යන්තම් සති දෙකක් ඉක්ම යන විටම, ආන්ඩුව ප්‍රතිවාදී ජනාධිපති අපේක්ෂක, විශ්‍රාමලත් හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා සහ ඔහුගේ ආධාරකරුවන් ගනනාවක් අත් අඩංගුවට ගත්තේය. ෆොන්සේකා ගෙතූ චෝදනා යටතේ මිලිටරි අත් අඩංගුවේ තබා ගෙන සිටී. මිලිටරි ජෙනරාල්වරයකු ලෙස, ෆොන්සේකා, ක්ෂමා විරහිත ලෙස සිවිල් යුද්ධයේ අවසන් අදියරයන් ක්‍රියාවට දැමූ අතර දෙදෙනා විරසක වන තෙක්ම, ඔහු රාජපක්ෂගේ අභ්‍යන්තර කවයේ කොටසක් විය.

යුද වියදම් සහ ජාත්‍යන්තර ආර්ථික පසුබෑස්මේ වැඩෙන බලපෑම හේතු කොට ගෙන රාජපක්ෂ ආන්ඩුව දැවැන්ත රාජ්‍ය නය කන්දරාවකට මුහුන දී සිටී. රාජ්‍ය නය අර්බුදයකට මුහුන දී සිටින සෙසු රටවල දී මෙන් ම, ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය, පසුගිය වසරේ ජූලි මස ගිවිස ගැනුනු එ.ජ. ඩොලර් බිලියන 2.6ක ඇප දී ගලවා ගැනීමේ නය මුදලට හිලව් වසයෙන්, ශ්‍රී ලංකාවේ ආන්ඩුව දැඩි කප්පාදු

පිලිවෙත් ක්‍රියාවට දැමිය යුතු යයි ඉල්ලා ඇත.

2009 දී සියයට 10ක් වූ අයවැය හිඟය මේ වසරේ දී සියයට 8 දක්වා ද 2012 වන වන විට සියයට 5 දක්වා ද කප්පාදු කිරීම එම පියවරවලට ඇතුලත් වේ. මෙයින් අදහස් කෙරෙන්නේ, බඳු බර ඉහල දැමීම, වැටුප් කැටි කිරීම් පැනවීම, අලුතෙන් බඳවා ගන්නා කම්කරුවන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහෝසි කිරීම සහ ඛනිජ තෙල් හා විදුලි බල සංස්ථා පුද්ගලීකරනය හෝ ප්‍රතිව්‍යුහගත කිරීම යි. මෙයින් සමහර පියවර අරඹා ඇතත්, ආන්ඩුව, නොවැම්බරයේ දී ඉදිරිපත් කිරීමට නියමිත සිය ඊලඟ අයවැයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩපිලිවෙලෙන් තවත් බොහෝ අංග ක්‍රියාවට දැමිය යුතුය.

රාජපක්ෂ, සිය සොහොයුරන් වන ආර්ථික සංවර්ධන ඇමති බැසිල් රාජපක්ෂ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, මිලිටරියේ ඉහල නිලධාරින් සහ ජ්‍යෙෂ්ඨ නිලධරයන් අතලොස්සක් ඇතුලත්, පොලිස්-මිලිටරි කට්ටුවක් තමන් වටා ගොඩනගාගෙන ඇත. එල්ටීටීඊයට එරෙහි යුද්ධය ගෙන යන අතරම, මෙම තන්ත්‍රය දේශපාලන විරුද්ධවාදීන් මත කඩාපනිමින්, මාධ්‍ය බියවද්දමින්, වෘත්තීය සමිතිවල සහායෙන් කම්කරු පන්තියේ අරගල මැඩපැවැත්වීය.

සියලු විරුද්ධ පක්ෂවල බංදනය වඩවඩා විශද වෙමින් තිබේ. එජාප නායක රනිල් වික්‍රමසිංහ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි මෑතම ප්‍රහාර සූදානම් කරනු වස් රාජපක්ෂට සහයෝගය දුන්නේය. පසුගිය ජූලියේ දී, ඔහු, මේ සතියේ තමන්ම "ආඥාදායකත්වය දෙසට තැබූ පියවරක්" ලෙස ප්‍රකාශ කල, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරන පිලිබඳ සාකච්ඡා කරනු වස් කෙරුනු රාජපක්ෂගේ ආරාධනාව නොපැකිල පිලිගත්තේය. එජාප මන්ත්‍රීන් අටක් ආන්ඩුවට මාරු වීම පෙන්නුම් කරන්නේ එජාප සහ පාලක සභාගය අතර කිසිදු මූලික මතභේදයක් නැති බවයි.

ජවිපෙ අඟහරුවාදා ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව කොලඹ දී විරෝධතාවක් සංවිධානය කලේය. ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, "ප්‍රජාතන්ත්‍රවාදය සමග සෙල්ලම් නොකරන" ලෙස ද "ජනතාවගේ හඬට ඇහුම්කන් දෙන" ලෙස ද රාජපක්ෂට ආයාචනා කලේය. ආන්ඩුවට බලපෑම් දැමීම එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී මාවත වෙනස් නොකරනු ඇත. ජවිපෙ 2005 දී රාජපක්ෂ බලයට ගෙන ඒමට සහාය විය, යුද්ධය යලි අරඹන ලෙස ඉල්ලා සිටියේය, දැන් එය, යුද්ධය ගෙනගිය ජෙනරාල්වරයා වන ෆොන්සේකා සමග සන්ධානයක සිටී.

ලංකා සමසමාජ පක්ෂය (ලසසප), ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය (කොප) සහ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුන (ප්‍රවාපෙ) යන සියල්ලෝ ම පාලක සභාගයේ කොටස්කරුවෝ ය. මුල දී ව්‍යවස්ථා සංශෝධන පිලිබඳ ඇල්මැරුනු විවේචන මතුකිරීමෙන් පසුව, ඔවුහු ඉක්මනින් ම ආන්ඩුවේ පිලිවෙතට අනුකුල වෙමින් සංශෝධන සඳහා ඡන්දය දුන්හ. ජනාධිපති උපදේශකයකු වන, ප්‍රවාපෙ මන්ත්‍රී වාසුදේව නානායක්කාර, සිය යටත්වීම යුක්තියුක්ත කරමින් මෙසේ ප්‍රකාශ කලේයඃ "අපි ආන්ඩුවට පක්ෂපාතී වුනත් මෙම සංශෝධනයට විරුද්ධයි. මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී බලවේගවලට අවශ්‍ය ආන්ඩුව පෙරලන්න. ඒක කරන්න ඉඩ දෙන්න අපිට බැහැ. අපි ආන්ඩුව ශක්තිමත් කල යුතුයි."

ව්‍යවස්ථා වෙනස්කම් කම්කරු පන්තියට තියුනු අනතුරු ඇඟවීමකි. ආන්ඩුවේ කප්පාදු පිලිවෙත්වලට එරෙහිව වැඩ කරන ජනතාව අතර නොවැලැක්විය හැකි ලෙසම වර්ධනය වනු ඇති ප්‍රතිරෝධය මර්දනය කරනු පිනිස, තමන් වර්ගවාදී යුද්ධය ගෙන යාමේ දී යොදා ගත් පොලිස්-රාජ්‍ය තන්ත්‍රය ශක්තිමත් කිරීමේ ක්‍රියාදාමයක රාජපක්ෂ යෙදී සිටී.

© www.wsws.org